සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

නම : ............................................... නාට්‍ය හා රංගකලාව කාලය : පැය 02 යි.

වැදගත් :

 l ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

l පහත පද්‍ය කොටස් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සෙල්ලම් සිතින් වත් - යම් කිසි තරහකින් වත්
මරණ සිතකින් වත් - සතුන්හට වද දීම නොහොබිත්

(ii) සාරසදිසි පෙති - පේර නෙලන කළ
වලගිය දෝ මගේ මේවරයා ......

(iii) ඇටිකිති චූස් - කුකුළු චරස්
හාවා කල - එකෙල මෙකෙල
මේ මරණින් බේරුනොතින්
තවත් නොකම් - හීල්බත් දංකුඩ

(iv) නරිබෑණෝ මේ අහන්න - දැවැද්දත් අරන් මෙන්න
අපි ආවා දූ බලන්න - ගෙට එන්නට දොර අරින්න.

(1) ජන ක්‍රීඩාවකට අයත් ගීතයක් වන්නේ,
1. (i) 2. (ii) 3. (iv) 4. (iii)

(2) සිරිත් මල්දමට අයත් පද්‍ය කොටස වන්නේ,
1. (ii) 2. (iv) 3. (i) 4. (iii)

(3) ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නාට්‍යයකට අයත් පද්‍ය කොටස වන්නේ,
1. (iii) 2. (i) 3. (iv) 4. (ii)

(4) ඉහත පද්‍ය ඇසුරින් ජන කතාවකට අදාළ වන්නේ,
1. (i) 2. (ii) 3. (iii) 4. (iv)

l පහත ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(5) වාචික අභිනය යනු,
1. මුහුණින් අදහස් ප්‍රකාශ කිරීමයි. 2. වචනයෙන් අදහස් ප්‍රකාශ කිරීමයි.
3. අතපයවලින් අදහස් ප්‍රකාශ කිරීමයි. 4. ඇඳුම්වලින් අදහස් ප්‍රකාශ කිරීමයි.

(6) වේදිකා නාට්‍ය කලාවේ විශේෂ ලක්ෂණයකි.

| | |
|---|---|
| 1. ඒක පුද්ගල කලාවක් වීම. | 2. ලිඛිත කලාවක් වීම. |
| 3. සජීවී කලාවක් වීම. | 4. ශ්‍රව්‍ය කලාවක් වීම. |

(7) අපට අනුකරණය කළ හැකි ස්වාභාවික පරිසරයේ සිදුවීමකි.

| | |
|---|---|
| 1. ගෙවල් සෑදීම. | 2. පන්ති කාමරය |
| 3. වෙළඳ පොල | 4. මල් පිපීම |

(8) වේදිකාවේ නළුවන් රඟපාන විට භාවිතා කරන භාණ්ඩ

| | |
|---|---|
| 1. රංග භාණ්ඩ යි. | 2. ඇඳුම් පැළඳුම් ය. |
| 3. රංග ආභරණ යි. | 4. රංග ආලෝකය යි. |

l **නොගැළපෙන පිළිතුර තෝරන්න.**

(9) සතර අභිනයට අයත් වේ.

| | |
|---|---|
| 1. වාචික අභිනය | 2. රංග අභිනය |
| 3. ආංගික අභිනය | 4. සාත්වික අභිනය |

(10) ජන ක්‍රීඩාවලින් වර්ධනය වන්නේ,

1. නීරෝගී බව  2. විනෝදය  3. සමගිය  4. වෛරය

l **පහත දී ඇති ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**
**(ශ්‍රව්‍ය , මනමේ, අනුකරණය, වෙල්ල වැහුම්, අධ්‍යක්ෂක)**

(11) සත්ව චරිත මිනිසුන්ට .................................................................... කළ හැකිය.

(12) ගුවන් විදුලි නාට්‍ය .................................................... කලාවකි.

(13) .................................................................. ප්‍රසිද්ධ ජන කථාවකි.

(14) වේදිකා නාට්‍යයක් පුහුණු කරන පුද්ගලයා ..................................................................... වරයයි.

(15) ......................................................... වේදිකා නාට්‍යයකි.

l **පහත වාක්‍ය හරිනම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( ✕ ) ලකුණ ද යොදන්න.**

(16) අත්දැකීම් ඇසුරින් නාට්‍ය නිර්මාණය කළ හැකිය. (...................)

(17) සිරිත් මල්දම ජීවිතයට වැදගත් නොවේ. (...................)

(18) රංග අභ්‍යාසවලින් ශරීරය නීරෝගී වේ. (...................)

(19) නළුවන් විවිධ ස්වරූපයෙන් සංවාද හැසිරවිය යුතුය. (...................)

(20) රඟපෑම තුළින් සබකෝලය ඇති වේ. (...................)

# II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2ක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
- **දී ඇති නාට්‍ය සංවාද ඇසුරින් පිළිතුරු සපයන්න.**

(01) පළමු මීයා : අහල නැද්ද එහා ගමේ
කුකුල් හාමිගේ විස්තර
අසරණ අපි වගේ අයට
උදව් දෙන්න හරි කැමතිලු.......

සියලු දෙනා ම : එහෙනම් අපි එහාට යමු
ගිහින් කුකුල් හාමි සොයමු
යමක් කමක් කරල දීලා
ඉන්ට කන්ට සොයා ගනිමු

(i) මෙම සංවාද ඇතුළත් නාට්‍ය කුමක් ද? (ලකුණු 02)
(ii) එහි අධ්‍යක්ෂවරයා කවු ද? (ලකුණු 02)
(iii) මෙම නාට්‍යයට අයත් චරිත නම් කරන්න. (ලකුණු 02)
(iv) මෙම නාට්‍ය තුළින් ලබාදෙන ආදර්ශය කුමක් ද? (ලකුණු 02)
(v) මෙහි එන මී හාමිලාගේ චරිත ලක්ෂණ ලියන්න. (ලකුණු 02)

(ලකුණු 2 x 5 = 10)

(02) (i) රංග ආභරණ යනු මොනවා ද? (ලකුණු 02)
(ii) රංග ආභරණ තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iii) ඔබ කැමති රංග ආභරණයක් ඇඳ එය සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න. (ලකුණු 05)

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) ජන ක්‍රීඩා තුනක් නම් කරන්න. (ලකුණු 03)
(ii) එක් ජන ක්‍රීඩාවකට අයත් කවියක් ලියන්න. (ලකුණු 03)
(iii) ජන ක්‍රීඩා හා රංග අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 04)

(ලකුණු 3 + 3 + 4 = 10)

(04) (i) ඔබට නිවසේ දී හමුවන චරිත තුනක් නම් කරන්න. (ලකුණු 02)
(ii) එක් චරිතයකට අදාළ භූමිකා තුනක් ලියන්න. (ලකුණු 02)
(iii) පහත වගුව චරිත 4 බැගින් ලියා සම්පූර්ණ කරන්න. (ලකුණු 06)

| මිනිස් චරිත | සත්ව චරිත | මනඃකල්පිත චරිත |
|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4. |

(ලකුණු 2 + 2 + 6 = 10)

(05) (i) පහත දී ඇති තොරතුරු ඇසුරින් අලුත් කතාන්දරයක් හෝ කවි පංතියක් නිර්මාණය කරන්න.
(මල්වත්ත, කුරුල්ලා, ළමයින්, පඹයෙක්, මුරකරුවෙක්) (ලකුණු 10)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

### නාට්‍ය හා රංගකලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | 3 | 11. | අනුකරණය | 16. | ✔ |
| 02. | 3 | 07. | 4 | 12. | ශ්‍රව්‍ය | 17. | ✕ |
| 03. | 3 | 08. | 1 | 13. | වෙල්ල වැහුම් | 18. | ✔ |
| 04. | 3 | 09. | 2 | 14. | අධ්‍යක්ෂක | 19. | ✔ |
| 05. | 2 | 10. | 4 | 15. | මනමේ | 20. | ✕ |

(ලකුණු 2 x 20 = 40)

### II කොටස

01. (i) පුංචි අපට දන් තේරෙයි.
(ii) සෝමලතා සුබසිංහ මහත්මිය
(iii) කුකුල්හාමි, මී පැටව් හතර දෙනා, මල්පාත්තිය
(iv) කම්මැලි නොවී වැඩකිරීම තුළින් ජීවිතය ජයගත යුතුයි යන්න
(v) අලස බව, බොරුකීම, කපටි බව, උපක්‍රමශීලී වීම. (ලකුණු 2 x 5 = 10)

02. (i) නළු චරිත සඳහා පළඳිනු ලබන සියලු ම දේ. (ලකුණු 3)
(ii) මාල, වළලු, කරාබු, ඔටුනු - පාවහන් වැනි දේ. (ලකුණු 3)
(iii) අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)
(ලකුණු 2 x 3 x 5 = 10)

03. (i) එළුවන් කෑම
මේවර කෙළිය
පනා හැංගීම වැනි ජන ක්‍රීඩා නම් කිරීමට
(ලකුණු 3)
(ii) අදාළ කවියක් ලිවීමට
(ලකුණු 3)
(iii) අලසකම දුරු වීම
සාමුහිකව ක්‍රියා කිරීමට හැකි වීම
ක්ෂණික තීරණ ගැනීම
ධාරණ ශක්තිය ඇති වීම වැනි දේ.......
(ලකුණු 4)
(ලකුණු 3 + 3 + 4 = 10)

04. (i) අම්මා, තාත්තා, අක්කා, මල්ලී, අය්යා, පූසා වැනි චරිත නම් කිරීමට
(ලකුණු 2)
(ii) චරිතයට අදාළ භූමිකා නම් කිරීමට
(ලකුණු 2)

උදා : අම්මා
- උපාසිකාව
- බිරිඳ
- සමිතියේ ලේකම්
- ගෘහණිය

(iii) **මිනිස් චරිත**
අම්මා, සරණපාල, නැන්දා, මල්ලී, නන්දා, පිස්සා, ගුරුතුමා

**සත්ව චරිත**
පූසා, බල්ලා, හාවා, මුවා, කොටියා

**මනඃකල්පිත චරිත**
හොල්මන, දෙවියෝ, සුරංගනාවිය, යක්ෂණිය, කිඳුරිය
(ලකුණු 6)

(ලකුණු 2 + 2 + 6 = 10)

05. කථාන්දරයට හෝ කවි පංතියට
(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

### නාට්‍ය හා රංගකලාව - ප්‍රායෝගික පරීක්ෂණය

01. ඔබ කැමති නාට්‍ය ගීතයක් ගයමින් රංගනය කරන්න. (ලකුණු 15)

02. පහත සඳහන් චරිත අතුරින් ඔබ කැමති චරිතයක් තෝරාගෙන නිරූපණය කරන්න.
- නපුරු වෙළෙන්දෙක්
- කපටි හිඟන්නෙක්
- ගුරුතුමියක්/ ගුරුතුමෙක්
- සාස්තර කියන්නෙක්
- පිස්සු චරිතයක් (ලකුණු 10)

03. පහත සඳහන් වාක්‍යවලින් එකක් තෝරාගෙන විවිධ අර්ථ තුනකට උච්චාරණය කරන්න.
- උඩ පනින්න එපා
- යන්න දෙන්න එපා
- මේ බලාගෙනයි
- අන්න අර කවුද (ලකුණු 05)

04. කණ්ඩායම් ක්‍රියාකාරකම් (ක්ෂණික නිරූපණ)
- පන්තියට නයෙක් ඇවිල්ලා
- මඩවලක නෙළුම් මලක් පිපිලා
- පූසෙක් කේක් කෑල්ලක් අරගෙන
- අල්ලපු වත්තේ ගසක කෙසෙල් කැනක් ඉදිලා (ලකුණු 10)

05. කතාන්දරයක් ඉදිරිපත් කිරීම. (ලකුණු 10)

(මුළු ලකුණු 50)